**බෙන්තොට ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත 17 ක් වෙනුවෙන් ගෙවිය යුතු ණයහිමි ශේෂය රු.7,124,195 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.7,848,172 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් හා ණයහිමි ශේෂය රු.723,977 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත 03 ක් වෙනුවෙන් ගෙවිය යුතු ණයහිමි ශේෂය රු.1,455,411 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,302,817 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් හා ණයහිමි ශේෂය රු.152,594 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිළදී ගෙන තිබූ රු.55,940 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) නවීකරණය කරන ලද කැබ් රථයේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේ දී ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීම් ගිණුමේ ශේෂය රු.1,500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා වියදම රු.14,591,697 ක් වුවද, පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබූ මුදල රු.13,038,600 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වැටුප් හා දීමනා රු.1,553,097 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,200,000 ක් ලෙස දක්වාත් තිබීමෙන් ලැබිය යුතු ආදායම් රු.353,097 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.4,248,455 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ තෑගි ඔප්පුවක් මඟින් සභාවට පවරා තිබූ රු.300,000 ක් වටිනාකමැති බෝගහගොඩ ඉඩම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

----------------------------

ගිණුම් විෂයයන් 12 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.4,324,185 ක වෙනසක් නිරික්ෂණය විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.113,014,720 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,459,925 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,242,459 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-----------------------

**2.2.1 වරිපනම් බදු හා අක්කර බදු**

-----------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.3,416,781 ක් වූ වරිපනම් බදු හා රු.116,781 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,383,833 ක උසාවි දඩ හා රු. 19,711,835 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.3 **කඩ කාමර බදු**

-----------------

2013 වර්ෂයේ බදු දී තිබුණ බෙන්තොට ඇල්පිටිය පාරේ අංක 01දරන කඩ කාමරයේ බදුකරුගෙන් 2014 මාර්තු මාසය වන විට රු.53,912 ක් අයවීමට තිබුණි.

**2.2.4 දුරකථන විදුලි සංදේශ කුළුණු බදු**

------------------------------------------

2009 අප්‍රේල් 17 දිනැති අංක:1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ විධිවිධාන අනුව සෑම කුළුණක් සඳහාම අනුකූලතා සහතිකයක් ලබා ගතයුතු අතර, එසේ ලබාගෙන නොමැති නම් අනුකූලතා සහතික නොමැතිව භාවිතා කිරීම මත අනුමත කර වසරක් ඉක්ම වූ දින සිට සභාවෙන් සංශෝධනයක් කර නොමැති නම් එක් දිනකට රු.50 බැගින් දඩ අයකල යුතු බව දක්වා තිබුණි. 2014 මැයි 24 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවන්හි දී සභා බලප්‍රදේශයේ ඉදිකර, භාවිතයට ගන්නා කුළුණු සඳහා රු.21,000 ක අනුකූලතා ගාස්තු හා දඩ අයකර නොතිබු බව 2014 මැයි මාසයේදි සිදුකරන ලද විගණන පරීක්ෂාවේදි අනාවරණය විය.

2.3 **අධිභාර**

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව මා විසින් 1983 වර්ෂය තුළ පනවන ලද අධිභාරයක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.6,238 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව සභාවේ සියළුම මන්ත්‍රීවරුන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවත්, සභාපති, උප සභාපති සහ සියලුම මන්ත්‍රීවරු 2013 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**3.2.1 බෝගහගොඩ එස්ටේට් ඉඩම් වෙන්දේසිය**

---------------------------------------------

අක්කර 04 යි පර්චස් 10 ක් වූ බෙන්තොට වලල්ලාවිට බෝගහගොඩ එස්ටේට් නම් ඉඩම කැබලි කිරීම සඳහා පුද්ගලික සමාගමකට 2013 පෙබරවාරි 13 දින කැබලි සැලැස්ම අනුමත කර සංවර්ධන බලපත්‍රය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් 2014 මාර්තු 26 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

* වෙන්දේසි ඉඩමෙන් සභාවට ලබා දී තිබූ පර්චස් 54.88 ක් වූ ඉඩම් කැබැල්ල, ඉඩමේ නිරිතදිග කොනේ ඕවිටකට මායිම්ව ප්‍රයෝජනයට ගතනොහැකි ස්ථානයක පිහිටා තිබුණි.

* ඉඩම ඇතුලත පාරවල් තාර දමා නොතිබූ අතර කානුවල දෙපැත්තම කොන්ක්‍රීට් කර නොතිබුණි.

*	විදුලි හා ජල පහසුකම් ලබා දී නොතිබුණි.

*	ඉඩමේ බටහිර කොනේ පිහිටි ඇල මාර්ගය සඳහා රක්ෂිතයක් නොතබා ඉඩම් කැබලි විකුණා තිබූ අතර, එලෙස විකුණන ලද ඉඩමක ඇලට මායිම්ව නිවසක් ද ඉදිකර තිබුණි.

### 3.2.2 සේවක ණය
---------------
සභාවේ සේවය කරන ලද ස්ථාන මාරු වී ගිය, සේවය අතහැර ගිය, මිය ගිය හා විශ්‍රාමික සේවකයින් 20 දෙනෙකුගෙන් අයවීම් හිඟහිටි ණය ශේෂය රු.67,676 ක් විය. ඉන් 16 දෙනෙකුගෙන් අය වියයුතු රු.41,398 ක ණය ශේෂය 2001 වර්ෂයට පෙර සිට හිඟ හිටව තිබූ අතර මෙම ණය ශේෂයන් අයකර ගැනීමට සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

### 3.3 අවිධිමත් ගනුදෙනු
--------------------
යාලේගම පැලැන්ගස්වත්ත පාර හා ආරච්චිමුල්ල කෝම්මල පාරේ කොටසක් ප්‍රතිසංස්කරණය කිරීම යන කර්මාන්ත දෙක සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාවල දක්වා ඇති මිල ගණන් ඉක්මවා ගෙවීම් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේදි සභා අරමුදලින් රු.63,266 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 3.4 නිශ්ක්‍රීය වත්කම්
-------------------
2013 ජුනි 05 දිනැති අංක: PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛයේ උපදෙස් පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණි. සභාව සතු ට්‍රැක්ටරයක් හා කැබ් රථයක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට දිරාපත් වෙමින් පවතින බවත් මෙම වත්කම් සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබූ බවත් 2014 මාර්තු මාසයේදි සිදුකළ විගණන පරික්ෂාවේදි නිරික්ෂණය විය.

## 4. පද්ධති හා පාලන
----------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ)	ගිණුම්කරණය
(ආ)	අයවැය පාලනය
(ඇ)	ආදායම් පරිපාලනය
(ඈ)	වත්කම් කළමනාකරණය